**කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

දුරකථන : 011 2686686
ෆැක්ස් : 011 2682668
විද්‍යුත් තැපැල : metnmc@gmail.com
වෙබ් අඩවිය : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** WW/O/23/02/03/01
වර්ණය : ඇම්බර්

## තද වැසි සහ තද සුළං පිළිබඳව අනතුරු ඇඟවීම

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2023 පෙබරවාරි මස 04 දින පෙ.ව 03.30 වන තෙක් වලංගු වන පරිදි
2023 පෙබරවාරි මස 03 දින ප.ව 09.30 ට නිකුත් කරන ලදී.

### කොළඹ සිට ගාල්ල සහ මාතර හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශය සඳහා

### සැලකිලිමත් වන්න!

දිවයිනට නිරිත දෙසින් වන මුහුදු ප්‍රදේශයේ පවතින ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය හේතුවෙන්, ඉහත සඳහන් මුහුදු ප්‍රදේශවල තද වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.

**ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.**

### අද ප.ව **09.00** වනවිට තත්ත්වය

දිවයිනට නිරිත දෙසින් වන මුහුදු ප්‍රදේශයේ වර්ධනය වූ ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය තවදුරටත් එම මුහුදු ප්‍රදේශයේ පවතී.

### අනාවැකිය

මෙම ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය ඉදිරි පැය කිහිපය තුලදීද සක්‍රියව පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.

**වර්ෂාපතනය(මි.මී)** : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි
**මුහුදේ ස්වභාවය** : නිසල (0-5)පැ.කි.මී ,සුමට (5-15)පැ.කි.මී, සාමාන්‍ය ස්වභාවයෙන් යුතු (16-28)පැ.කි.මී, මද රළු (29-37)පැ.කි.මී, තරමක් රළු (38-46)පැ.කි.මී, රළු (47-55)පැ.කි.මී, ඉතා රළු (56-74)පැ.කි.මී, දළ රළු (75-102)පැ.කි.මී, ඉතා දළ රළු 103 පැ.කි.මී ට වැඩි.